**37.** " මහාරයක් " හෝ " කයිකූලියක් " ඉල්වන්නාවූ නොහොත් ඉල්ලීමට අදහස්කර සිටින්නාවූ යම් ස්ත්‍රියකට, අසනීපයක් නිසා හෝ දුර්වලකමක් නිසා හෝ අනිකුදු සෑහෙන කරුණක් නිසා හෝ තමාටම පෙනී සිටීමට නොහැකි බව ක්වාසි කෙනෙකු පිළිගන්නා අන්දමට ඔප්පු කළහොත්, ඈ වෙනුවෙන් පෙනී සිටීමට ඇය විසින් බලය පවරනුලැබූ පුද්ගලයෙකුගේ පත්කිරීම ක්වාසි කෙනෙකු විසින්ද අනුමත කරන ලද්දේනම්, එකී ඉල්ලුම්කරු වෙනුවෙන් නඩු පැවරීමට හෝ ඇය වෙනුවෙන් පෙනී සිටීමට හෝ එකී තැනැත්තාට ඉඩදීමට ඉහතකී ක්වාසිතැනට පිළිවන.

මහාරය හෝ කයිකූලිය ඉල්ලීමේදී ස්ත්‍රියක වෙනුවෙන පෙනී සිටීම.

**38.** (1) " මහාරය " හෝ " කයිකූලිය " සඳහා මෙම පනත යටතේ පවත්වනුලබන නඩු විභාගයකදී යම් ඉල්ලුම්කාර ස්ත්‍රියක වෙනුවට 37වෙනි වගන්තිය යටතේ අනිකෙකු පෙනී සිටිනවිට එම ස්ත්‍රියට අයිති, ක්වාසිතැන විසින් ලබාගන්නාලද සියලු මුදල් 55වෙනි වගන්තියේ කෙසේ සඳහන්වී තිබෙණ නමුදු එකී ඉල්ලුම්කාර ස්ත්‍රිය නමින්ම ක්වාසිතැන විසින් කච්චේරියේ තැන්පත් කළ යුතුය.

(2) 1වෙනි උප වගන්තිය යටතේ ක්වාසි කෙනෙකු විසින් කච්චේරියේ තැන්පත් කරනලද කිසි මුදලක් එසේ ආපසු ගැනීම සඳහා ක්වාසිතැන විසින් ලිපියකින් බලය දුන්විට විනා කිසිවෙකුට ආපසු නොගතහැකිය. මුදල ඉල්ලුම් කළ ස්ත්‍රියගේ නඩත්තුව පිණිස හෝ ප්‍රයෝජනය පිණිස හෝ එම මුදල යොදන බැව් ක්වාසි තැනට ඒත්තුගිය විටක විනා එසේ තැන්පත් කරනලද සම්පූර්ණ මුදල හෝ ඉන් කොටසක් ආපසු ගැනීමට ක්වාසිතැන විසින් බලය නොදිය යුතුය.

37වෙනි වගන්තිය යටතේ අනිකෙකු පෙනී සිටිමින් ඉල්ලුම්කොට ක්වාසි කෙනෙකු විසින් ලබාගන්නාලද මුදල් වලට තුමක් කළ යුතුද යන්න.

**39.** ස්ත්‍රියකගේ " මහාරය " හෝ ඉන් කොටසක් හෝ ලබාගැනීම පිණිස පවරනු ලබන නඩුවක් පිළිබඳ නඩු පැවරීමේ කාලසීමාව, මරණින් හෝ දික්කසාදවීමෙන් හෝ විවාහය අවසන්වන තෙක් පටන් නොගන්නේය. එසේ විවාහය අවසන්වී අවුරුදු තුනක් ඇතුළතදී පටන්ගතහොත් එබඳු නඩුවක් ගෙනයා හැකිය.

" මහාරය " සඳහා නඩු පැවරීමේ කාල සීමාව.

VI වෙනි කාණ්ඩය

**රිජිස්ත්‍රාර් ජනරාල්තැනගේද, දිස්ත්‍රික් ලේකම්වරුන්ගේද, ක්වාසි මණ්ඩලයේද, ක්වාසිවරුන්ගේද, ලේකම්වරුන්ගේද**

**බලතල හා යුතුකම්**

**40.** ක්වාසිවරුන් හා ලේකම්වරුන් විසින් මෙම පනත යටතේ තැබියයුතු පොත් හා ලේකම් පොත් වරින්වර පරීක්ෂාකිරීමට හෝ කරවීමට රිජිස්ත්‍රාර් ජනරාල්තැනට හෝ දිස්ත්‍රික් ලේකම් කෙනෙකුට හෝ පිළිවන. තවද එම පොත් හෝ ලේකම් පොත් පිළිබඳවද නැතහොත් ක්වාසිවරුන්ගේ හෝ ලේකම්වරුන්ගේ හැසිරීම පිළිබඳව ද කරනු ලබන පැමිණිලි විභාග කිරීමට ද ඔවුන්ට පිළිවන.

ලේකම්පොත් පරීක්ෂා කිරීම රිජිස්ත්‍රාර් ජනරාල්තැනට හා දිස්ත්‍රික් ලේකම් වරුන්ට ඇති බලය.

52වෙනි වගන්තිය යටතේ ගෙවනලද මුදල් යෙදවීමට දිස්ත්‍රික් ලේකම්වරුන්ට ඇති බලය.

41. 52වෙනි වගන්තියේ 1වෙනි උප වගන්තියේ දෙවෙනි අතුරු විධානයට අයත් විධිවිධාන ප්‍රකාර ක්වාසි කෙනෙකු විසින් දිස්ත්‍රික් ලේකම් කෙනෙකුට ගෙවනලද සියලු මුදල් ඒ පිළිබඳව නියම කළ හැකි පරිදි ඔහු විසින් යෙදිය යුතුය.

ක්වාසිවරුන්ගේ ලේඛන සටහන් පිටපත් බැඳ තැබවීමට නියම කිරීම දිස්ත්‍රික් ලේකම් තැනගේ යුතුකම බව.

42. 54වෙනි වගන්තියේ විධිවිධාන අනුව ක්වාසිවරුන් විසින් තමා වෙත යවනලද සියලුම සටහන් පිටපත් සාමාන්‍ය ලේකම් පොතක් ලෙස එකට බැඳ තැබවීම සෑම දිස්ත්‍රික් ලේකම් කෙනෙකු විසින් කළ යුතුය.

ලේඛන ගෙන්වා ගැනීමට ක්වාසි මණ්ඩලයට ඇති බලය.

43. මෙම පනත යටතේ යම්කිසි කරුණක් පිළිබඳව ක්වාසි කෙනෙකු ඉදිරියේ පවත්වනු ලබමින් තිබෙණ නැතහොත් අවසානවී තිබෙණ යම්කිසි නඩු විසඳීමක් හෝ විභාගයක් පිළිබඳ ලේඛනයක්, එහිදී කර තිබෙණ නියෝගයක නීත්‍යානුකූලත්වය හෝ සුදුසු භාවය නැතහොත් විභාගයේ ක්‍රමානුකූලත්වය පිළිබඳව කරුණු සොයාගැනීම සඳහා, ගෙන්වා පරීක්ෂාකිරීමට ක්වාසි මණ්ඩලයට පිළිවන.

ක්වාසි මණ්ඩලයට අයත් සංශොධන බලතල.

44. (1) ක්වාසි මණ්ඩලය විසින් ගෙන්වාගන්නාලද ලේඛනයක ඇතුළත්වී තිබෙන නීති කෘත්‍යයක් සම්බන්ධයෙන් ඒ මණ්ඩලය වෙත පැවරී තිබෙණ ඇපෑල් අධිකරණ බලයට අයත් යම්කිසි බලයක් සිය අභිමතය පරිදි පාවිච්චි කිරීමට එකී මණ්ඩලයට පිළිවන.

(2) ක්වාසි මණ්ඩලය විසින් යමෙකුට විරුඬව මෙම වගන්තිය යටතේ ආඥාවක් කිරීමේදී ඒ සඳහා උත්තර කියා සිටීමට ඔහුටම හෝ ඔහු වෙනුවෙන් පෙනී සිටින්නෙකුට හෝ අවස්ථාව සලසාදී හැර, එසේ නොකළ යුතුය.

(3) මෙම වගන්තිය යටතේ ක්වාසි මණ්ඩලයක් විසින් කරනු ලැබූ සෑම ආඥාවක්ම ක්වාසි කෙනෙකුගේ ආඥාවකට විරුඬව ගන්නාලද ඇපෑලකදී කරනලද ආඥාවක් මෙන්ම බලපවත්වන්නේය.

මුස්ලිම් නීතිය පිළිබඳ ප්‍රශ්න වලදී රිජිස්ත්‍රාර් ජනරාල් වෙත සිය අදහස් දන්වාසිටීම ක්වාසි මණ්ඩලයේ යුතුකම බව.

45. මෙම පනත හෝ එය යටතේ සාදනලද නියෝගයක් හෝ ක්‍රියාකරවීමේදී පැනනැගියහැකි මුස්ලිම් නීතිය පිළිබඳ යම් ප්‍රශ්නයක් ගැන ක්වාසි මණ්ඩලයේ අදහස් විමසා රිජිස්ත්‍රාර් ජනරාල්තැන විසින් ලියා යවනලද ඉල්ලීමකට ක්වාසි මණ්ඩලය විසින් සිය අදහස් ලියා යැවිය යුතුය.

ක්වාසිකෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද නීති ප්‍රශ්න පිළිබඳව සිය අදහස් ප්‍රකාශ කිරීම ක්වාසි මණ්ඩලයේ යුතුකම බව.

46. (1) තමා ඉදිරියේදී විභාගවන යම්කිසි නඩුවකදී පැනනගින මුස්ලිම් නීති ප්‍රශ්නයක් ක්වාසි මණ්ඩලයක කල්පනාව සඳහා තැබීම තමාට සුදුසුයයි වැටහෙන අවස්ථාවකදී ක්වාසි කෙනෙකුට එය කළ හැකිය. තවද, එබඳු අවස්ථාවකදී ක්වාසි මණ්ඩලයේ කල්පනාව සඳහා තබනලද නීති ප්‍රශ්නය පිළිබඳ මණ්ඩලයේ අදහස තමා වෙත දන්වන තෙක් එම නඩු විභාගය පිළිබඳ වැඩිදුරට ක්‍රියා නොකළ යුතුය.

(2) 1වෙනි උප වගන්තිය යටතේ මුස්ලිම් නීති ප්‍රශ්නයක් ක්වාසි මණ්ඩලයේ කල්පනාව සඳහා තබන්නාවූ සෑම ක්වාසි කෙනෙක්ම එය විශෙෂ ප්‍රශ්නයක් වශයෙන් ලියා යැවිය යුතුය. තවද එකී ප්‍රශ්නය කල්පනා කර බැලීමේදී එයට සම්බන්ධවන යම් කිසි කරුණු තිබේ නම් ඒවාද සංක්‍ෂෙපයෙන් සඳහන් කළ යුතුය.

(3) 1වෙනි උප වගන්තිය යටතේ ක්වාසි මණ්ඩලයක කල්පනාව සඳහා ක්වාසි කෙනෙකු විසින් තබනලද සෑම නීති ප්‍රශ්නයක්ම හැකි පමණ ඉක්මණින් විසඳා ඒ පිළිබඳ ඔවුන්ගේ අදහස, ප්‍රශ්නය එවූ ක්වාසිතැනට ක්වාසි මණ්ඩලය විසින් දැන්විය යුතුය. එකී ප්‍රශ්නය පැනනැගුණු නඩු විභාගයේදී ඉහත සඳහන් අදහසට එකී ක්වාසිතැන යටත්විය යුතුය.

47. (1) මෙම පනත යටතේ ක්වාසිවරුන්ට පැවරී තිබෙණ බලතලවලට, පහත සඳහන් කරුණු විභාගකොට ඒවා තීරණය කිරීමේ බලයද ඇතුළත්ය :— ක්වාසිවරුන්ගේ සාමාන්‍ය බලතල.

(අ) "මහාරය" ආපසු ලබාගැනීම පිණිස භායඞාවකගේ ඉල්ලීමක් ;

(ආ) භායඞාවක විසින් හෝ ඇය වෙනුවෙන් ඇයගේ නඩත්තුව සඳහා කරන ඉල්ලීමක් ;

(ඉ) සුජාත හෝ අවජාත දරුවෙකු විසින් නැතහොත් එබඳු දරුවෙකු වෙනුවෙන් ඔහුගේ නඩත්තුව සඳහා කරනුලබන ඉල්ලීමක් ;

(ඊ) දික්කසාදයක් ලියා පදිංචි කරන තෙක් නොහොත් "ඉද්දත්" කාලය තුළදී සිය නඩත්තුව සඳහා දික්කසාද භායඞාවක විසින් කරන ඉල්ලීමක් නැතහොත් දික්කසාදය ලියා පදිංචි කිරීමේදී එබඳු ස්ත්‍රියක් ගැබ් උසුලමින් සිටී නම් ඇගේ දරු උපත සිදුවන තෙක් නඩත්තුව ඉල්ලීමක් ;

(උ) මෙම වගන්තිය යටතේ හෝ මෙම පනතින් අවලංගු කරන ලද පරණ පනතෙහි 21වෙනි වගන්තිය යටතේ හෝ නියම කරනලද නඩත්තු මුදලක් වැඩිකිරීම හෝ අඩුකිරීම සඳහා කරනු ලබන ඉල්ලීමක් ;

(ඌ) "කයිකූලිය" සඳහා කරනු ලබන ඉල්ලීමක් ;

(එ) භායඞාවකගේ නොහොත් දික්කසාද කරනු ලැබූ භායඞාවකගේ වැදුම්ගෙයි වියදම සඳහා ඇය විසින් කරනු ලබන ඉල්ලීමක් ;

(ඒ) සවාමිපුරුෂයෙකු හා භායඞාව වෙනුවෙන් ක්වාසි කෙනෙකුගේ මැදහත්වීම පිණිස කරනු ලබන ඉල්ලීමක් ;

(ඔ) සවාමිපුරුෂයෙකු විසින් හෝ භායඞාවක විසින් හෝ විවාහය අවලංගුකිරීම පිණිස කරනු ලබන ඉල්ලීමක් ;

(ඕ) දෙලොස්විය පසු නොවූ භායඞාවකගේ විවාහය ලියා පදිංචි කිරීම සඳහා බලය ලබාගැනීම පිණිස කරනු ලබන ඉල්ලීමක්ද වේ.

එසේදවූවත් මෙම වගන්තිය යටතේ හෝ මෙම පණතින් අවලංගු කරනලද පැරණි පනතෙහි 21වෙනි වගන්තිය යටතේ හෝ නියමකරනලද නඩත්තුකිරීමේ නියෝගයක්, ක්වාසිකෙනෙකුට සුදුසු කරුණු පෙන්වීමෙන් පසු සියලුම පාර්ශවකාරයින්ට දන්වා විනා වෙනස් නොකළ යුතුය.

(2) යම් ස්ත්‍රියකගේ විවාහයක් සඳහා ඇගේ වාලි විසින් දියයුතු කැමැත්ත අයුතු ලෙස නොදී සිටින අවස්ථාවකදී එබඳු "වාලි" කෙනෙකුට විරුඩව ඇය විසින් හෝ ඇය වෙනුවෙන් හෝ කරනු ලබන පැමිණිල්ලක් විභාගකොට සුදුස්සක් කිරීමට ක්වාසිකෙනෙකුට පිළිවන. තවද අවශ්‍ය නම් විවාහය සඳහා බලය දෙමින් "වාලි"ගේ පැමිණීම හෝ කැමැත්ත අනවශ්‍ය බව දන්වන නියෝගයක් කිරීමටද ඔහුට පිළිවන.

(3) යම් ස්ත්‍රියකට "වාලි" කෙනෙකු නොමැති අවස්ථාවකදී තමාට අවශ්‍ය ලෙස වැටහෙන අන්දමේ විභාගයක් පවත්වා විවාහය සඳහා බලය දෙමින් "වාලි"කෙනෙකුගේ පැමිණීම හෝ කැමැත්ත අනවශ්‍ය බව දන්වන නියෝගයක් කිරීමටද ක්වාසිකෙනෙකුට පිළිවන.

(4) විවාහයකට බලය දෙමින් 2වෙනි උප වගන්තිය හෝ 3වෙනි උප වගන්තිය යටතේ නියෝගයක් කරනු ලැබූ විට එම විවාහය ලියා පදිංචි කරන ලෙස බල පවරන අවසරයක් ක්වාසි විසින් නිකුත්කළ යුතුය. එහෙත් එම නියෝගය කිරීමේ දිනය සිට දින දහයක කාලයක් ගතවන තෙක්ද, එබඳු නියෝගයකට විරුඩව ඇපැල්කර තිබේනම් ක්වාසි මණ්ඩලය එම නියෝගය ස්ථිරකරන තෙක්ද ශ්‍රෙෂ්ඨාධිකරණයට ඇපැල්ගෙන තිබේ නම් එහිදීද ස්ථිරකරන තෙක්ද, එබඳු අවසරයක් නිකුත් නොකළ යුතුය.

(5) මෙම වගන්තියේ "දික්කසාද කරනුලැබූ භාය්‍යාව" යන්නට "තලක්" ප්‍රකාශකරනු ලැබ ස්වාමිපුරුෂයා විසින් නැවත භාර නොගන්නා ලද භාය්‍යාවක්ද අයත්ය.

(6) මෙම වගන්තිය යටතේ පවත්වනුලැබූ සෑම විභාගයක්ම හතරවෙනි උපලේඛනයේ සඳහන් ව්‍යවස්ථාවලට හැකි පමණ එකඟවන ලෙස පැවැත්විය යුතුය. එහෙත් එබඳු විභාගයකදී ක්වාසි කෙනෙකුගේ සහාය පිණිස කිසිම මුස්ලිම් උපදේශකයෙකු පත්නොකළ යුතුය.

47වෙනි වගන්තියේ දක්වන කරුණු විභාග කිරීමට ක්වාසි කෙනෙකුට අනන්‍ය අධිකරණ බලය ඇයි බව.

48. මෙම පණතෙහි ඒ සඳහා දක්වෙන යම්කිසි විශෙෂ විධිවිධානවලට යටත්ව, 47වෙනි වගන්තිය යටතේ ක්වාසි කෙනෙකු විසින් පාවිච්චිකළයුතු අධිකරණ බලය අනන්‍ය වන්නේය. තවද එම අධිකරණ බලයේ යටතට පැමිණෙන යම් කිසි කරුණක් අන් කිසිම අධිකරණයක් විසින් හෝ අධිකරණ සභාවක් විසින් හෝ විසඳීම හෝ විභාගකිරීම හෝ නොකළ යුතුය.

ක්වාසිවරුන්ගේ ධූරය පිළිබඳ දිව්රුම්ගැනීම.

49. සෑම ක්වාසිකෙනෙක්ම ක්වාසි ධූරයට පත්කරනුලැබූ වහාම මෙම පනත යටතේ යම්කිසි බලයක් පාවිච්චි කිරීමට හෝ යුතු කමක් ඉෂ්ට කිරීමට හෝ ප්‍රථම සිය ධූරය පිළිබඳව දිව්රුම් ගත යුතුය.

දිවුරුම් දිවුරවීමට ක්වාසිකෙනෙකුට ඇති බලය.

**50.** මෙම පනත යටතේ පවත්වනුලබන විභාගයකදී නොහොත් අන්කිසි නීති කෘත්‍යයකදී සාක්ෂිකරුවන්ට හෝ මුස්ලිම් උප දේශකයින්ට දිවුරුම් දිවුරවීමට සෑම ක්වාසිකෙනෙකුටම මෙයින් බලපවරනු ලැබේ.

ක්වාසිවරු ආරක්ෂක ඔප්පුවලට ඇතුළත් වියයුතු බව.

**51.** (1) සෑම ක්වාසිකෙනෙක්ම සිය ධුරයට අයත් කටයුතු ආරම්භකිරීමට ප්‍රථම සිය යුතුකම් අවංක ලෙස ඉෂ්ටකිරීමේ පොරොන්දුව පිට රුපියල් එක්දහක ආරක්ෂක ඔප්පුවකට ඇතුළත් විය යුතුය.

(2) 12වෙනි හෝ 13වෙනි වගන්තියක් යටතේ පත්කරනුලැබූ ක්වාසිකෙනෙකුගේ ආරක්ෂක ඔප්පුවකට අත්සන් කළයුත්තේ දිස්ත්‍රික් ලේකම් ඉදිරියෙහිදීය. 14වෙනි වගන්තිය යටතේ පත් කරනලද ක්වාසිකෙනෙකුගේ ආරක්ෂක ඔප්පුව අත්සන් කළයුත්තේ රිජිස්ත්‍රාර් ජනරාල්තැන ඉදිරියෙහිදී ය. නැතහොත් රිජිස්ත්‍රාර් ජනරාල්තැන විසින් ඒ සඳහා බලය දුන් දිස්ත්‍රික් ලේකම්කෙනෙකු ඉදිරියෙහිදී ය.

(3) නිශ්චල දේපළ උකස්කිරීමෙන් හෝ චංචල දේපළ තැන්පත් කිරීමෙන් හෝ දිස්ත්‍රික් ලේකම්තැන නැතහොත් රිජිස්ත්‍රාර් ජනරාල්තැන භාරගන්නා අන්‍දමේ ඇපකරුවන් දෙදෙනෙකුගේ නැතහොත් වැඩිගණනකගේ ඇපවීමකින් හෝ ඉහතකී මුදල මහ-රජතුමන් සඳහාද එතුමන්ගේ උරුමක්කාරයින් හා උත්තරාධිකාරීන් සඳහාද ආරක්ෂා කළ යුතුය.

(4) එකී එක් එක් බැඳුම්කරය, අවසථානුකූලව දිස්ත්‍රික් ලේකම් තැනගේ හෝ රිජිස්ත්‍රාර් ජනරාල්තැනගේ හෝ කායභීලයෙහි තැබිය යුතුය.

ලබනලද හා ගෙවනලද මුදල් පිළිබඳ ලේඛනයක් ක්වාසිවරුන් විසින් තැබිය යුතු බව.

**52.** (1) මෙම පනතේ හෝ එය යටතේ සාදනලද නියෝගවල හෝ සඳහන් විධිවිධාන යටතේ ක්වාසිකෙනෙකු විසින් ලබාගන්නා ලද එක් එක් මුදල නියමිත පොතෙහි සටහන්කොට එම මුදල අයිති තැනැත්තාට එය වහා ගෙවිය යුතුය.

එසේවුවද යම් මුදලක් ලැබියයුතු තැනැත්තා දහඅතර වියෙන් අඩු ළමයෙකු වූ විට එය ක්වාසිතැනගේ අභිමතය පරිදි එම ළමයා කලින් කල භාරව සිටි තැනැත්තාට ගෙවිය හැකිය.

තවද යම් මුදලක් ලැබිය යුතු තැනැත්තා සොයාගත නොහැකි වූ විට ද ක්වාසිතැනට මුදල ලැබුණු දින සිට මාසයක් ඇතුළත මුදල ඉල්ලා නොසිටින විට ද ක්වාසිතැන විසින් දිස්ත්‍රික් ලේකම්තැනට එම මුදල ගෙවිය යුතුය.

(2) 1වෙනි උප වගන්තියේ විධිවිධාන අනුව ක්වාසිකෙනෙකු විසින් ගෙවනලද එක් එක් මුදල පිළිබඳව සටහනක් නියමිත පොතෙහි ඔහු විසින් වහා ඇතුළත් කළ යුතුය. තවද එබඳු එක් එක් ගෙවීමක්, නියමිත ආකෘතිය අනුව පිළියෙළකොට, ලබන්නා විසින් අත්සන්කරනලද කුවිතන්සියකින් සහිරකළ යුතුය.

**38වෙනි වගන්තිය යටතේ තැන්පත් කරනලද හෝ ආපසු ගන්නාලද මුදල් පිළිබඳව ක්වාසිවරුන් විසින් දිස්ත්‍රික් ලේකම්තැනට වාර්තාකළ යුතු බව.**

53. 38වෙනි වගන්තියේ විධිවිධාන ප්‍රකාර යම් මුදලක් කච්චේරියේ තැන්පත්කරන්නාවූද නැතහොත් යම් මුදලක් ඉන් ආපසු ගැනීම සඳහා බලය දෙන්නාවූද සෑම ක්වාසිකෙනෙක්ම එසේ තැන්පත් කරනලද හෝ ආපසු ගන්නාලද මුදලෙහි ප්‍රමාණයද, මුදල තැන්පත්කළ හෝ ආපසු ගැනිමට බලය දුන් හෝ දිනයද ඉල්ලුම් කරුගේ නම ද, නියම කළ හැකි අන්කිසි විස්තරයක්ද දිස්ත්‍රික් ලේකම්තැනට වහාම වාර්තා කළ යුතුය.

**සටහන්වල පිටපත් හා සූචිලේඛනද ක්වාසිවරුන් විසින් මාස්පතා දිස්ත්‍රික් ලේකම්වරුන්ට යැවිය යුතු බව.**

54. නියෝගයකින් අන් අන්දමට සඳහන්කර නොමැතිවිටක සෑම ක්වාසිකෙනෙක්ම එක් එක් මාසය අවසානයේදී ඔහුගේ පොත්වල හෝ ලේකම් පොත්වල හෝ සූචි ලේඛනවල හෝ ඔහු විසින් ඒ මාසය ඇතුළත කරනලද සියලුම සටහන්වල පිටපත්, නියමිත ආකෘතියක සත්‍ය බවට දිවුරා දිස්ත්‍රික් ලේකම්තැන වෙත යැවිය යුතුය. ක්වාසිකෙනෙකු ඉදිරියෙහි පවත්වන විභාගයක ලේඛන සඳහාද, නැතහොත් දික්කසාද ලේකම් පොතක සටහන් සඳහාද මෙම වගන්තියෙහි ඉහත සඳහන් විධිවිධාන අදාළ නොවන්නේය.

**පොත් හා ලේකම්පොත පිළිබඳ සූචි ලේඛන ක්වාසිවරුන් හා ලේකම්වරුන් විසින් තැබිය යුතු බව.**

55. නියෝගයකින් අන් අන්දමකට සඳහන්කර නොමැති විටක තමා විසින් තබා තිබෙන සෑම පොතක හා ලේකම් පොතක අඩංගු කරුණු පිළිබඳව ව්‍යවහාරයට යොදන සූචි ලේඛනයක් නියමිත ආකෘතිය අනුව ඉංග්‍රීසියෙන් හෝ දෙමළෙන් හෝ සිංහලෙන් හෝ තැබීම සෑම ක්වාසිකෙනෙකු විසින් හා ලේකම් කෙනෙකු විසින් කළ යුතුය.

**ලේකම් පොත් ආදිය ක්වාසිවරුන්ගේ හා ලේකම්වරුන්ගෙ භාරයේ තැබිය යුතු බව.**

56. (1) නියමකළහැකි අවස්ථාවලදී හෝ බලය ඇති අධිකරණයකින් නිකුත්කරනලද ආඥාවක් අනුව හෝ හැර අන් අවස්ථාවකදී, මෙම පනත යටතේ ක්වාසිකෙනෙකු විසින් හෝ ලේකම්කෙනෙකු විසින් තැබියයුතු ලේකම්පොතක්, පොතක් නැතහොත් අන්කිසි ලේඛනයක් තබා ගැනීමට එබඳු ක්වාසිකෙනෙකු හෝ ලේකම් කෙනෙකු විසින් කිසිවෙකුට ඉඩ නොදිය යුතුය.

(2) සියලුම ලේකම්පොත්, පොත් හා සූචි ලේඛන එවා සම්පූර්ණයෙන් ලියා අවසන්වනතෙක් තබා සිට ඊට පසුව තැන්පත්කර තැබීම සඳහා දිස්ත්‍රික් ලේකම් වෙත යැවිය යුතුය.

(3) ක්වාසිකෙනෙකු හෝ ලේකම්කෙනෙකු තමා පත්කරනු ලැබූ ප්‍රදේශය අත්හැර ගිය විටක හෝ සිය ධුරයෙන් අස්වූවිට හෝ තමාගේ පත්වීම අවලංගුකරනු ලැබූවිට, ඔහු විසින්ද, ඔහු නැසී ගියවිට ඔහු වෙනුවෙන් නීත්‍යනුකූලව පෙනීසිටින්නෙකු විසින්ද ඔහුගේ පොත්, ලේකම්පොත් හා සූචි ලේඛන දිස්ත්‍රික් ලේකම්තැන වෙත වහා භාරදිය යුතුය. එසේ භාර නුදුන්විට දිස්ත්‍රික් ලේකම්තැන විසින් සිය භාරයට ගතයුතුය.

(4) ක්වාසි කෙනෙකු හෝ ලේකම් කෙනෙකු නොවන්නාවූ කිසිවෙකු විසින් මුස්ලිම් විවාහ හෝ දික්කසාද ලේකම් පොතක් හෝ එබඳු පොතක් සේ හඟවන යම්කිසි පොතක් හෝ ලේකම් පොතක් හෝ නොතැබිය යුතුය. එසේම මෙම පනතෙහි හෝ මෙම පනතින් අවලංගු කරනලද පැරණි පනතෙහි විධිවිධාන යටතේ අන් කිසිවකු විසින් දික්කසාදයක් සිදුකිරීමක් නැතහොත් සිදුකරන බව හඟවන අවස්ථාවක් පිළිබඳවූ යම්කිසි විභාගයක් ඇතුළත් ලේඛනයක් නොතැබිය යුතුය.

57. මෙම පනත සඳහා පත්කරන සෑම මුස්ලිම් උපදේශකයෙක්ම සිය කටයුතු ආරම්භ කිරීමට මත්තෙන් නියමිත ආකෘතියට අනුව උපදේශකයෙකු ලෙස දිව්රුම් දිය යුතුය. මුස්ලිම් උපදේශක යෙකුගේ දිව්රුම.

58. (1) විවාහයක් ලියා පදිංචි කරන ලේකම් හෝ දික්කසාදයක් ලියා පදිංචි කරන ක්වාසි හෝ විවාහ ලේකම් පොතෙහි නැතහොත් දික්කසාද ලේකම් පොතෙහි දෙවන පිටපත වෙන්කොට, විවාහය හෝ එකී දික්කසාදය ලියා පදිංචි කරනුලැබූ මාසයට පසු මාසයෙහි පස්වෙනිදාට ප්‍රථම ප්‍රාදේශික ලේකම්තැනට එය යැවිය යුතුය. විවාහයක් පිළිබඳවනම් 18වෙනි වගන්තියේ 1වෙනි උප වගන්තියේ කළයුතු ප්‍රකාශයන්ද ඒ සමග යැවිය යුතුයි. විවාහ හා දික්කසාද ලේකම් පොත්වල දෙවන පිටපත් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත යැවීමේ යුතුකම.

(2) 11වෙනි වගන්තියේ අතුරු විධානය යටතේ බලය ලැබූ ලේකම් කෙනෙකු විසින් විවාහයක් ලියා පදිංචි කර තිබෙණ විට 1වෙනි උප වගන්තියෙන් අවශ්‍ය කටයුතු කිරීම හැර විවාහ ලේකම් පොතෙහි ඇතුළත් විස්තරවල සහතික පිටපත්ද, ප්‍රකාශයන්හි සහතික පිටපත්ද, විවාහය ලියා පදිංචි කිරීම සඳහා බලය දුන් ලිපියේ සහතික පිටපතක්ද විවාහය ලියා පදිංචි කරනලද ප්‍රදේශයේ අධිකරණ බලය ඇති දිස්ත්‍රික් ලේකම්තැන වෙත යැවිය යුතුය.

(3) 1වෙනි උප වගන්තියේ විධිවිධාන අනුව දිස්ත්‍රික් ලේකම්තැන වෙත යවනුලැබූ සියලු දෙවන පිටපත් හා ප්‍රකාශ ඔහු විසින් රිජිස්ත්‍රාර් ජනරාල්තැන වෙත යැවිය යුතුය. එවිට රිජිස්ත්‍රාර් ජනරාල්තැන විසින් එකී දෙවන පිටපත් හා ප්‍රකාශ සිය කාර්යාලයෙහි ප්‍රවේසම් කර තැබිය යුතුය.

59. (1) මෙම පනත යටතේ කරනුලබන එක් එක් කාර්යයකදී තමාගේ ගාස්තුව වශයෙන් නියමිත ප්‍රමාණ මුදලක් නියමිත අයගෙන් ඉල්ලා භාරගැනීමට සෑම ලේකම් කෙනෙකුටම බලය තිබේ. ලේකම්වරුන් විසින් අය කළයුතු ගාස්තු.

(2) මෙම පනත යටතේ කරනුලබන එක් එක් කාර්යය සඳහා නියමිත ගාස්තුව දක්වන සටහනක් ඉංග්‍රීසි, දෙමළ සහ සිංහල යන භාෂාත්‍රයෙන් පිළියෙළකොට සිය ගෘහයෙහි ප්‍රකට ස්ථානයක තැබීම සෑම ලේකම් කෙනෙකු විසින්ම කළ යුතුය.

## VII වෙනි කාණ්ඩය

### ඇපැල් ගැනීම

ක්වාසි වරුන්ගේ ආඥාවලට විරුඬව ඇපැල් ගැනීම.

**60.** (1) තුන්වෙනි උපලෙඛනයෙහි සඳහන් නිති යටතේ හෝ 47වෙනි වගන්තිය යටතේ පවත්වනලද විභාගයකදී හෝ ක්වාසි කෙනෙකු විසින් කරනලද අන්තිම ආඥාවකට විරුඬව ක්වාසි මණ්ඩලයට ඇපැල් ගැනීමට යමෙකුට බලය තිබේ.

එසේද වුවත්, 47වෙනි වගන්තිය යටතේ කරනු ලබන විභාගයකදී, හතරවෙනි උපලේඛනයේ සඳහන් ව්‍යවස්ථා අනුව නියත ආඥාවක් කරනු ලැබූ විට, ඊට විරුඬව ඇපැල් ගැනීමක් නැත්තේය.

(2) මෙම වගන්තිය යටතේ ගන්නාලද සෑම ඇපැලක්ම පස්වෙනි උපලේඛනයේ ව්‍යවස්ථාවලට එකඟව විභාගකොට තිරණය කළ යුතුය.

රෙජිස්ත්‍රාර් ජනරාල් තැනගේ හෝ දිස්ත්‍රික් ලේකම් වරුන්ගේ හෝ නියෝග වලට විරුඬව ඇපැල් ගැනීම.

**61.** 8වෙනි වගන්තිය යටතේ අක්තයක් දීමට බැරියයි කියමින් හෝ නැතහොත් දෙනුලැබූ අක්තයක් අවලංගු කරමින් නොහොත් ආපසු ඉල්ලමින් හෝ රිජිස්ත්‍රාර් ජනරාල්තැන විසින් කරනු ලබන සෑම නියෝගයක්ම ඇමතිවරයා වෙත ඇපැල් ගැනීමට යටත් වන්නේය; 32වෙනි වගන්තිය යටතේ හෝ 67වෙනි වගන්තිය යටතේ හෝ දිස්ත්‍රික් ලේකම්තැන විසින් කරනු ලබන සෑම නියෝග යක් ද රිජිස්ත්‍රාර් ජනරාල්තැන වෙත ඇපැල් ගැනීමට යටත් වන්නේය. ඉහතකී සෑම ඇපැලක්ම, ඇපැල් ගන්නාලද නියෝගය ඒ ඒ අය වෙත දැනුම් දෙනුලැබූ දින සිට දින 14ක් ඇතුලතදී, කළ යුතුය.

ශ්‍රෙෂ්ඨාධි කරණයට ඇපැල් ගැනීම.

**62.** (1) 60වෙනි වගන්තිය යටතේ ක්වාසි මණ්ඩලයක් වෙත ඇපැල්ගැනීමේදී එම මණ්ඩලය විසින් කරනලද ආඥාවකට විරුඬවූ යමෙකුට, ශ්‍රෙෂ්ඨාධිකරණයට ඇපැල් ගැනීමේ අවසරය කලින් ලබා, එකී ආඥාවට විරුඬව එම අධිකරණය වෙත ඇපැල්ගත හැකිය.

(2) ක්වාසි මණ්ඩලයක් විසින් කරනලද නියෝගවලට විරුඬව් ඇපැල්ගැනීම පිණිස ශ්‍රෙෂ්ඨාධිකරණයෙන් අවසර ඉල්ලීමද, ඊට පසුව ඇපැල් ගැනීමද, එම අවස්ථාවලදී අයවියයුතු ගාස්තුද සංවිධාන කරන සාමාන්‍ය අණපනත් අධිකරණ පනතේ 49වෙනි හා 50වෙනි වගන්ති අනුව සුදුසුයයි සැහෙන පරිදි කලින් කල සෑදීම ශ්‍රෙෂ්ඨාධි කරණයේ විනිශ්චයකාරවරුන්ට ද නැතහොත් අග්‍රවිනිශ්චයකාර තුමන් ඇතුළු විනිශ්චයකාරවරුන් පස්දෙනෙකුට ද කළ හැකිය.

**63.** පස්වෙනි උපලේඛනයේ ව්‍යවස්ථාවක හෝ මෙම පනත යටතේ ක්වාසිවරුන්ගේ නියෝගවලට විරුඬව ඇපෑල් ගැනීම පිළිබඳව පනවනලද ව්‍යවස්ථාවක හෝ කෙසේ සඳහන්වී තිබුන නමුදු පහත දක්වෙන කටයුතු කිරීමට ක්වාසි මණ්ඩලයට බලය තිබේ—

කාලසීමාව ඉකුත්වීම් ආදියක් සිදුවීමෙන් පසුවද ඇපැල් ගැනීම.

(අ) ඇපෑලක් කාලසීමාව ඉකුත්වීමෙන් පසුව ඉදිරිපත්කර තිබෙණ විට අසනීපයක් නිසා හෝ අවාසනාවක් නිසා හෝ නොවැළැක්විය හැකි යම්කිසි කරුණක් නිසා හෝ නියම කාලය තුළදී ඒ ඇපෑල ගැනීමට නොහැකිවී තිබෙණ බව මණ්ඩලයට ඒත්තුගියහොත්, එබඳු අවස්ථාවකදී ඇපෑල භාරගැනීම ; නැතහොත්

(ආ) ඇපෑල් පෙත්සමක් මුද්දර නොඅලවා හෝ ඇලවිය යුතු ප්‍රමාණයට අඩුවෙන් මුද්දර අලවා හෝ ඉදිරිපත් කරනු ලැබූ විට, නියම මුද්දර ගාස්තුව මෙන් දෙගුණයක් වටිනා මුද්දරද නැතහොත් අඩු මුද්දර ප්‍රමාණයට දෙගුණයක් මුද්දරද සපයා ඉදිරිපත් කළහොත් එය භාරගැනීම ද වේ.

## VIII වෙනි කාණ්ඩය

### ආඥ ක්‍රියාවෙහි යෙදවීම

**64.** (1) මහාරයක් හෝ කයිකූලියක් අයකරගැනීම පිණිස නොව 47වෙනි වගන්තිය යටතේ අන්කිසි නීති කෘත්‍යයකදී ඉල්ලනුලැබූ යම් මුදලක් ලබාගැනීමට ක්වාසි කෙනෙකු ඉඩදුන්විට නැතහොත් ඇපෑල්ගැනීමෙන් පසු ක්වාසි මණ්ඩලය ඉඩදුන් විට ද නැතහොත් නැවතද ඇපෑල්ගැනීමෙන් පසු ශ්‍රෙෂ්ඨාධිකරණය ඉඩදුන්විටද එම මුදල නොගෙව්විටකදී මෙම පනත යටතේ නියම කරනුලැබූ දඩ මුදලක් මෙන් එය අයකරගත හැකිය. තවද, එම මුදල අයකර ගැනීමේදී එය ගෙවියයුතු තැනැත්තා එවකට පදිංචිව සිටින ප්‍රදේශයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්තැනට ඒ සඳහා ඉල්ලීමක් කිරීමෙන් එය කළ හැකිය.

" මහාර " සඳහා හෝ " කයිකූලි " සඳහා හෝ නොව 47වෙනි වගන්තිය යටතේ වෙනත් ඉල්ලීම්වලට අයවිය යුතු මුදල් අයකර ගැනීම.

(2) 1වෙනි උප වගන්තිය යටතේ කරනු ලබන සෑම ඉල්ලීමක්ම ක්වාසි කෙනෙකු විසින් කළ යුතුය. එය තමාගේ නමින් පිළියෙළවූ සහතිකයකින් අනුමතකළ යුතුය. එම සහතිකයෙහි, අයවියයුතු මුදලෙහි ප්‍රමාණයද, මුදල ගෙවියයුතු තැනැත්තාගේ නමද, මුදල අයිති තැනැත්තාගේ නම හෝ තැනැත්තන්ගේ නම්ද, අයකරගැනීමට නියම කළ ආඥව කරනුලැබූ විභාගය තනි පිට අසන ලද්දක්ද නැතහොත් පාර්ශවකාරයන් අතර අසන ලද්දක්ද යන්නද ඇතුළත් විය යුතුය.

1වෙනි උප වගන්තිය යටතේ සඳහන් කර තිබෙණ සෑම මුදලක්ම මහෙස්ත්‍රාත් කෙනෙකුට තමාගේ සාමාන්‍ය අධිකරණ බලය අනුව දඩගැසියහැකි වැඩිම දඩ මුදලට වැඩි මුදලක් වුවද දඩ

මුදලක් ලෙස අයකරගත හැකිය. එම මුදල එසේ අයකරගත් විට එය අයිතිකාරයාට යථා කාලයෙහි ගෙවනු පිණිස ක්වාසිතැනට යැවිය යුතුය.

"මහාර" හෝ "කයිකූලි" පිළිබඳවූ ඉල්ලීම්වලදී අයවියයුතු මුදල් ලබාගැනීම.

**65.** (1) 47වෙනි වගන්තිය යටතේ මහාරයක් හෝ කයිකූලියක් ලබාගැනීම පිණිස කරනුලබන ඉල්ලීමකට ඉඩදීමේදී ක්වාසි කෙනෙකු හෝ ක්වාසි මණ්ඩලයකට ඇපැල්ගත් විට එම මණ්ඩලය හෝ ශ්‍රෙෂ්ඨාධිකරණයට වැඩිදුරටත් ඇපැල්ගත් විටකදී එම අධිකරණය හෝ එකී මුදල එහිදී කරනුලබන ආඥාවේ සඳහන් පරිදි කොටස් වශයෙන් හා නියමිත දිනවල ක්වාසිතැනට යැවිය යුතුයයි නියම කළ හැකිය.

(2) 1වෙනි උප වගන්තිය යටතේ කරනලද ආඥාවක සඳහන් යම්කිසි කොටස් මුදලක් නොගෙවූ විට තමාගේ අභිමතය පරිදි තමාගේ නමින් පිළියෙළ කරනලද දැන්වීමක් එම මුදල ගෙවියයුතු තැනැත්තාට භාරකොට එකී දැන්වීමේ සඳහන් කාලය තුළදී එකලට ගෙවියයුතුව තිබෙණ සම්පූර්ණ මුදල තමාට ගෙවන ලෙස නියමකිරීමට ක්වාසිතැනට පිළිවන. එකී තැනැත්තා එම දැන්වීමෙහි සඳහන් කාලය තුළදී එකී මුදල නොගෙව්විට තමා පත්කරනුලැබූ ප්‍රදේශයෙහි අධිකරණ බලය ඇති රික්වෙස්ට් උසාවියට තමාගේ නමින් සහතිකයක් යැවීමට ක්වාසිතැනට පිළිවන. එම සහතිකයෙහි, නොගෙවා ඉතිරිව තිබෙණ මුදල් ප්‍රමාණය ද එය ගෙවියයුතු තැනැත්තාගේ නම ද, එය ලැබියයුතු තැනැත්තාගේ නම ද අනිකුත් අවශ්‍ය විස්තර ද ඇතුළත් කළ යුතුය.

එකී මුදල ලැබියයුතු තැනැත්තා විසින් ඒ සඳහා නියමිත මුද්දර ගාස්තුව ක්වාසිතැනට ගෙවූ විටක විනා එබඳු සහතිකයක් පිළියෙළ නොකළ යුතුය.

(3) 2වෙනි උප වගන්තිය යටතේ රික්වැස්ට් උසාවියක් වෙත යවනුලැබූ සෑම සහතිකයක්ම එම උසාවියේ නඩුකාරතැන විසින් සටහන් කළ යුතුය. තවද එය, එම උසාවියේ එසේ සටහන් කරනු ලැබූ දිනයේදී කරනලද මුදල් අයකිරීමේ නඩු තීන්දුවක් ලෙස සැළකිය යුතුය. එකී සහතිකයෙහි සඳහන් කර තිබෙණ මුල් මුදල් එකී උසාවියේ සාමාන්‍ය අධිකරණ බලයෙන් සීමාවූ මුදලට වැඩිවුවද එකී තීන්දුවට සම්බන්ධවූ සියලුම පාර්ශවකාරයින්ම ඊට යටත්විය යුතුවත් හැර එකී නඩු තීන්දුව එකී උසාවියේ නඩු තීන්දුවක් මෙන්ම ක්‍රියාවේ යෙදවිය හැකිය. එම සහතිකය පිළිබඳව රික්වැස්ට් උසාවියේ කරනුලබන සෑම නඩු විභාගයක්ම එකී සහතිකයෙහි සඳහන් මුදල පිළිබඳවූ නඩුවක මුද්දර ගාස්තු ප්‍රමාණයට ම, මුද්දර ගාස්තුවට යටත් වන්නේය.

එසේ වුවද එබඳු මුදලක් රුපියල් තුන්සියයකට වැඩිවූ විට මුද්දර ගාස්තු සැපයිය යුත්තේ එය රුපියල් තුන්සියයක මුදලක් වූවාක් මෙන්ය

(4) මෙම වගන්තියේ ඉහත දක්වනලද විධිවිධාන යටතේ කරන ලද නඩු විභාගයකදී මහෙස්ත්‍රාත්වරයෙකු විසින් කරන ලද ආඥාවකට විරුඬව ශ්‍රෙෂ්ඨාධිකරණයට ඇපැල්ගත නොහැකිය.

*නඩත්තුව සඳහා කරන ලද ආඥා කඩකිරීමේදී ඇතිවිය යුතු ක්‍රියා පරිපාටිය.*

**66.** මෙම පනත යටතේ නඩත්තු මුදල ගෙවීම පිණිස ක්වාසි කෙනෙකු විසින් ආඥාකරනුලැබූ කෙනෙකු එකී ආඥාව යටතේ ක්‍රියා නොකොට පැහැර හැරීමෙන් 64වෙනි වගන්තිය යටතේ ක්වාසිතැන විසින් මහෙස්ත්‍රාත්තැන වෙත ඉල්ලීමක් කළවිටදී, මහෙස්ත්‍රාත්වරුන් විසින් නියම කරනලද දඩ මුදල් අයකරගැනීම සඳහා නියමිත අඳුමට, එම මුදල් අයකරගැනීමට වරෙන්තුවක් නිකුත් කිරීමට එකී ආඥාව කඩකරනුලැබූ සෑම අවස්ථාවකදීම මහෙස්ත්‍රාත් කෙනෙකුට පිළිවන. තවද වරෙන්තුව ක්‍රියා කරවීමෙන් පසුවද එකී තැනැත්තා විසින් නොගෙවා ඉතිරිවී තිබෙණ යම්කිසි මුදලක් හෝ ඉන් කොටසක් හෝ ඇතහොත් ඒ සඳහා මාසයකට වැඩිනොවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට එබඳු තැනැත්තා බන්ධනාගාරගත කිරීමට නියම කිරීමට මහෙස්ත්‍රාත්තැනට පිළිවන.

එසේ වුවද, ඉහතකී ආඥාව තනිපිට පවත්වනලද නිති කෘත්‍යයකදී කරනලදැයි ක්වාසිතැන සහතිකකොට තිබී එකී ආඥාවට යටත්වුණු තැනැත්තා විසින් එම විභාගය නැවත පැවැත්විය යුතුයයි මහෙස්ත්‍රාත්තැනට දැන්වූවිට, මහෙස්ත්‍රාත්තැන නියම කරනලද දිනයක හෝ නැවත විභාග කිරීමේ ඉල්ලීම ක්වාසිතැන විසින් ප්‍රතික්ෂෙප කරන ලද්දේ නම් එසේ ප්‍රතික්ෂෙප කරලැබූ දින සිට දින තුනක් ඇතුළතදී හෝ මේ දින දෙකකින් කලින් පැමිණෙන දිනයේදී එසේ මහෙස්ත්‍රාත් උසාවිය ඉදිරියේ පැමිණීම පිණිස ප්‍රමාණවත් මුදලකට එකී තැනැත්තා ලවා ඇප ඔප්පුවක් අත්සන් කරවා ඔහු නිදහස් කළ යුතුය.

## IX වෙනි කාණ්ඩය

### සාමාන්‍ය

*විභාගයක් එක් ක්වාසි කෙනෙකු ගෙන් තවත් කෙනෙකුට මාරුකිරීම.*

**67.** (1) මෙම පනත යටතේ ක්වාසි කෙනෙකු ඉදිරියේ පවත්වන ලද නැතහොත් පවත්වන්ට නියමකර තිබෙණ නඩු විභාගයකදී, එකී ක්වාසිතැනගෙන් සාධාරණවූත් අපක්ෂපාතවූත් විභාගයක් නොලැබේයයි එකී විභාගයේ පාර්ශවකාරයෙකු විසින් හෝ ඊට සම්බන්ධවූ යමෙකු විසින් හෝ දිස්ත්‍රික් ලේකම්තැන වෙත ඉල්ලීමක් කරන ලදුව ඔහුට ඒ බව එසේයයි වැටහී ගියවිට 14වෙනි වගන්තිය යටතේ පත්කරනුලැබූ විශෙෂ ක්වාසි කෙනෙකු විසින් එම විභාගය පැවැත්විය යුතුයයි නියම කිරීමට එකී දිස්ත්‍රික් ලේකම්තැනට පිළිවන. එසේ නියම කළ විට ඉහත කී ඉල්ලීමට සම්බන්ධවූ යම්කිසි විභාගයක් පළමු කී ක්වාසි ඉදිරිපිට පවත්වන ලද්දේ නම් එය නිෂ්ඵල වන්නේය.

(2) විශෙෂ ක්වාසිතැනගේ ගමන් ගාස්තු හා අනිකුත් ගාස්තු ගෙවීම සඳහා නියමිත මුදල ඉල්ලුම්කරු විසින් ලේකම්තැන වෙත තැන්පත් කරන තෙක් 1වෙනි උප වගන්තිය යටතේ ආඥාවක් කරනු නොලැබේ.

*ලේකම් පොත් හා සූචිලේඛන පරීක්ෂණය පිණිස තැබිය යුතු බව.*

68. ක්වාසි මණ්ඩලයක් ඉදිරියේ හෝ ක්වාසි කෙනෙකු ඉදිරියේ විභාගවෙමින් තිබෙන නීති කෘත්‍යයක් සම්බන්ධ ලෙඛනද, මෙම පනත යටතේ හෝ මෙම පනතින් අවලංගු කරනලද පැරණි පනත යටතේ ක්වාසිවරුන් සහ ලේකම්වරුන් විසින් තබනලද සාමාන්‍ය ලේකම් පොත් හා පොත්ද, ලේකම් පොත් හා සූචි ලේඛනද පරීක්ෂා කිරීම සඳහා අවසර ඉල්ලන්නෙකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට සුදුසු සෑම කාලවේලාවලදීම එසේ පරීක්ෂා කිරීම සඳහා තැබිය යුතුය. තවද නියමිත ගාස්තුව ගෙවා ඒ සඳහා ඉල්ලීමක් කළ අයෙකුට රිජිස්ත්‍රාර් ජනරාල්තැන විසින් හෝ දිස්ත්‍රික් ලේකම්තැන විසින් හෝ ක්වාසි මණ්ඩලයේ ලේකම්තැන විසින් හෝ ක්වාසි කෙනෙකු විසින් හෝ ලේකම් කෙනෙකු විසින් හෝ ඉහතකී ලෙඛන වල සඳහන් සටහනක පිටපතක් තමන්ගේ නමින් සැබෑ ලෙස සහතික කොට නිකුත් කළ යුතුය.

*කලින් වලංගුව තිබුණ නීති යටතේ තබනලද ලෙඛනපරීක්ෂා කිරීම පිණිස තැබිය යුතු බව*

69. 1886යේ මහමදගම්කාරයින්ගේ විවාහ ලියා පදිංචි කිරීමේ පනත යටතේ තැබිය යුතුව තිබී දැනට දිස්ත්‍රික් ලේකම් කෙනෙකුගේ භාරයේ තිබෙන සියලු ලෙඛන, එය පරීක්ෂාකිරීම සඳහා අවසර ඉල්ලන්නෙකු විසින් නියමිත ගාස්තුව ගෙවූවිට, සුදුසු කාල වේලාවන්හිදී ඔහුගේ පරීක්ෂණය සඳහා තැබිය යුතුය. තවද නියමිත ගාස්තුව ගෙවූවිට එබඳු ලෙඛනයක හෝ සටහනක පිටපතක් සැබෑ ලෙස සහතිකකොට, දිස්ත්‍රික් ලේකම්තැන විසින් නිකුත්කළ යුතුය.

*ලේකම් පොත් හා පිටපත් සාක්ෂි බව.*

70. ක්වාසි කෙනෙකුගේ හෝ ලේකම් කෙනෙකුගේ සෑම පොතක් හෝ ලේකම් පොතක්ද, සෑම සාමාන්‍ය ලේකම් පොතක්ද රිජිස්ත්‍රාර් ජනරාල්තැන විසින් හෝ දිස්ත්‍රික් ලේකම් කෙනෙකු විසින් හෝ ක්වාසි මණ්ඩලයේ ලේකම්තැන විසින් හෝ ක්වාසි කෙනෙකු විසින් හෝ ලේකම් කෙනෙකු විසින් හෝ සැබෑ ලෙස සහතික කරනුලැබූ එබඳු පොතක, ලේකම් පොතක ඇතුළත් සටහනක පිටපතක්ද, එබන්දකින් උපුටාගත් සෑම ලිපි කොටසක්ද 69වෙනි වගන්තියේ සඳහන් සෑම ලෙඛනයක්ද දිස්ත්‍රික් ලේකම් තැන විසින් සැබෑ බවට සහතික කරනලද එබඳු ලෙඛනයක පිටපතක් නැතහොත් එබඳු ලෙඛනයක සහතික පිටපතක්ද, එබඳු පොතක, ලේකම් පොතක, සාමාන්‍ය ලේකම් පොතක පිටපතක නොහොත් උපුටාගත් කොටසක ඇතුළත්වී තිබෙණ දින හා කරුණු සම්බන්ධයෙන්, සියලු අධිකරණයන්හි බැලු බැල්මට පිළිගත හැකි සාක්ෂ්‍යයක් වන්නේය.

**විවාහ ලේකම් පොතෙහිහෝ දික්කසාද ලේකම් පොතෙහි සටහනක් හොඳම සාක්ෂ්‍යය බව.**

71. මෙම පනතෙහි 18වෙනි වගන්තිය යටතේ තැබියයුතු විවාහ ලේකම් පොතකද 29වෙනි වගන්තිය යටතේ තැබියයුතු දික්කසාද ලේකම් පොතකද නැතහොත් 1886යේ මහමදගම්කාරයින්ගේ විවාහ සටහන් කිරීමේ පනත අනුව හෝ මෙම පනතින් අවලංගු කරනුලැබූ පැරණි පනත අනුව හෝ තබනලද ලේකම් පොතකද ඇතුළත් සටහනක සහතික පිටපතක් එකී සටහන සම්බන්ධවන විවාහය හෝ දික්කසාදය පිළිබඳව සෑම අධිකරණවලදීම හොඳම සාක්ෂ්‍යය වශයෙන් භාරගත යුතුය.

**පොත් ආදිය නොමිලයේ සැපයිය යුතු බව.**

72. ක්වාසිවරුන් හා ලේකම්වරුන් විසින් තැබියයුතු ලේකම් පොත් සඳහාද අනිකුත් සියලු ලේඛන සඳහාද පාවිච්චිකිරීම පිණිස, නොලියූ අළුත් පොත්, ක්වාසි කෙනෙකු හෝ ලේකම් කෙනෙකු හෝ ඉල්ලූවිටකදී දිස්ත්‍රික් ලේකම්තැන විසින් ඒවා නොමිලයේ සැපයිය යුතුය. (ඉහත සඳහන් ලේකම් පොත් අවශ්‍යවන අන්දමට මුලපත්‍ර සහ උප පත්‍රවලින් යුක්ත විය යුතුය).

**ක්වාසි මණ්ඩලයේ සභිකයන්ද, එම මණ්ඩලයෙහි ලේකම්ද, ක්වාසිවරුන්ද රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.**

73. ක්වාසි මණ්ඩලයේ සෑම සභිකයෙක්ද, එම මණ්ඩලයෙහි ලේකම්ද, සෑම ක්වාසි කෙනෙක්ද දණ්ඩනීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයෙකු ලෙස සැළකිය යුතුය. තවද ක්වාසි මණ්ඩලය ඉදිරියෙහි හෝ ක්වාසි කෙනෙකු ඉදිරියෙහි හෝ මෙම පනත යටතේ පවත්වනලද සෑම විභාගයක්ම දණ්ඩනීති සංග්‍රහයේ XI වෙනි පරිච්ඡේදයේ අර්ථානුකූලව අධිකරණ කෘතීන් ලෙස සැළකිය යුතුය.

**ක්වාසිවරුන් ඉදිරිපිට පාර්ශව කාරයින් සහ සාක්ෂිකාරයින් වෙනුවෙන් පෙනීසිටීම.**

74. මෙම පනත යටතේ ක්වාසි කෙනෙකු ඉදිරියේ පවත්වනලද කිසි විභාගයක පාර්ශවකාරයෙකු හෝ සාක්ෂිකාරයෙකු වෙනුවෙන් අධිනීතිඥයෙකුට හෝ නීතිඥයෙකුට පෙනීසිටීමට බලය නැතිවාක් මෙන්ම අවසරද දෙනු නොලැබේ.

ක්වාසි මණ්ඩලය ඉදිරිපිටදී පවත්වනු ලබන යම්කිසි විභාගයක් සම්බන්ධයෙන් මෙම වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන අදාළ නොවන්නේය.

**පොලිස් නිලධාරීන් විසින් හා ගම් මුලාදෑනීන් විසින් ක්වාසිවරුන්ටඋපකාර කිරීමේ යුතුකම.**

75. ක්වාසි මණ්ඩලයට හා ක්වාසිවරුන්ට මෙම පනත යටතේ පැවරී තිබෙණ බලතල හා අධිකරණ බලය පාවිච්චි කිරීමේදීද, යුතුකම් ඉෂ්ටකිරීමේදීද, ඔවුන්ට ආධාරකිරීම සෑම පොලිස් නිලධාරියෙකුගේ හා ගම් මුලාදෑනියෙකුගේද යුතුකම වන්නේය.

**ලේකම්වරුන් විසින් සාදනලද සටහන්වල දෙවන පිටපත් නැතිවීම.**

76. ලේකම් කෙනෙකු විසින් හෝ ක්වාසි කෙනෙකු විසින් කරන ලද සටහනක මුල් පත්‍රය හෝ දෙවන පිටපත නැතිවූ විට, සටහනෙහි උප පත්‍රය තිබේනම් නැතිවූ ලේඛනය සඳහා උප පත්‍රයෙහි පිටපතක් තැබවීමට රිජිස්ට්‍රාර් ජනරාල්තැනට පිළිවන. එකී පිටපත ලේකම් තැන විසින් හෝ ක්වාසිතැන විසින් හෝ සැබෑ බවට සහතික කළ පසු දිස්ත්‍රික් ලේකම්තැන විසින් අත්සන්කොට අනුමත කළයුතුය. එසේ සහතිකකොට අත්සන් කිරීමෙන් අනුමතකරනුලැබූ පිටපතක් එකී සටහනෙහි දෙවෙනි පිටපත සේ සළකනු ලැබේ.

ලේකම් පොත්වල ලිපි දෝෂ ශුද්ධකිරීම.

**77.** මෙම පනත සඳහා තබා තිබෙන්නාවූ ද, මෙම පනතින් අවලංගු කළ පැරණි පනත යටතේ හෝ 1886යේ මහමදුගම්කාර යන්ගේ විවාහ ලියා පදිංචිකිරීමේ පනත යටතේ හෝ තැබිය යුතුවූ ද යම්කිසි ලේකම් පොතක හෝ අනිකුදු ලේඛනයක තිබී කලින් කල සොයාගනුලබන ලිපි දෝෂයක්, ඒ සඳහා සුදුසු විභාගයක් පවත්වා ශුද්ධකිරීම, රිජිස්ත්‍රාර් ජනරාල්තැනට හෝ ඒ සඳහා රිජිස්ත්‍රාර් ජනරාල්තැන විසින් බලය පවරනලද කෙනෙකුට හෝ ඒ ඒ අවස්ථානුකූලව නියමකළ හැකි අන්දමටද, ක්‍රියා පරිපාටියටද් එකඟව, පිළිවන.

ආකෘති පත්‍ර.

78. මෙම පනතෙහි කාර්‍යයන් සඳහා පළමුවෙනි උපලේඛනයෙහි දක්වා තිබෙණ ආකෘති පත්‍ර ඒ ඒ අවස්ථාවලට අවශ්‍ය වන පරිදි වෙනස්කිරීම් සහිතව, පාවිච්චි කළ යුතුය.

## X වෙනි කාණ්ඩය

### වැරදි සහ දඬුවම

ලේකම් පොත් ආදිය නැතිකර දැමීම ගැන දඬුවම.

**79.** මෙහි පහත සඳහන් කරන යම්කිසිවක් කරන්නාවූ සෑම කෙනෙක්ම වරදකට වරදකාරයාවී, එසේ වරදකාරයා කිරීමේදී අවුරුදු තුනකට වැඩි නොවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමට යටත් වන්නේය :—

(අ) මේ පනත යටතේ හෝ 1886යේ මහමදුගම්කාරයන්ගේ විවාහ ලියා පදිංචි කිරීමේ පනත යටතේ හෝ මෙම පනතින් අවලංගු කරනලද පැරණි පනත යටතේ හෝ තබනලද නැතහොත් නිකුත් කරනලද යම්කිසි නීති කෘත්‍යයක ලේඛනයක්, ලේකම් පොතක්, පොතක්, අවසර පත්‍රයක් නැතහොත් අන්කිසි ලේඛනයක් ඕනෑකමින් නැතිකර දැමීම, ඊට හානියක් කිරීම නැතහොත් එසේ කරවීම ; හෝ

(ආ) එබඳු ලේකම් පොතක්, පොතක්, අවසර පත්‍රයක් හෝ ලේඛනයක් නැතහොත් ඉන් කොටසක්ද, එබඳු ලේකම් පොතක, අවසර පත්‍රයක හෝ ලේඛනයක සහතික පිටපතක් ලෙස පෙනෙන යම්කිසි ලේඛනයක් නැතහොත් ඉන් කොටසක්ද එබන්දක කොටසක් නැතහොත් උපුටා ගත් ලිපි කොටසක් නැතහොත් ඉන් කොටසක්ද යන මේවායින් යමක් අසත්‍ය ලෙස හෝ කූට ලෙස සෑදීම ; හෝ

(ඉ) එබඳු ලේකම් පොතක, පොතක, අවසර පත්‍රයක, ලේඛනයක නැතහොත් එබන්දක සහතික පිටපතක හෝ එබන්දකින් උපුටාගත් ලිපි කොටසක ඕනෑකමින් අසත්‍ය සටහනක් ඇතුළත් කිරීම ද වේ.

ාබා තිබෙන්නාවූ ද, මෙම පනතින්
ාටතේ හෝ 1886යේ මහමදගම්කාර
ිරීමේ පනත යටතේ හෝ තැබිය
ාතක හෝ අනිකුදු ලේඛනයක තිබී
ෂි දෙෂයක්, ඒ සඳහා සුදුසු විභාගයක්
ජී ජනරාල්තැනට හෝ ඒ සඳහා
ී බලය පවරනලද කෙනෙකුට හෝ
ු හැකි අන්දමටද, ක්‍රියා පරිපාටියටද

ෘත් සඳහා පළමුවෙනි උපලෙඛනයෙහි
ඒ ඒ අවස්ථාවලට අවශ්‍ය වන පරිදි
කළ යුතුය.

වනි කාණ්ඩය

ී සහ දඬුවම

කරන යම්කිසිවක් කරන්නාවූ සෑම
යාවී, එසේ වරදකාරයා කිරීමේදී අවුරුදු
කට දෙයාකාරයෙන් එක් ආකාරයකට
ත් වන්නේය:—

හෝ 1886යේ මහමදගම්කාරයන්ගේ
කිරීමේ පනත යටතේ හෝ මෙම
කරනලද පැරණි පනත යටතේ හෝ
ත් නිකුත් කරනලද යම්කිසි නීති
ක්, ලේකම් පොතක්, පොතක්, අවසර
ත් අන්කිසි ලෙඛනයක් ඕනෑකමින්
ා හානියක් කිරීම නැතහොත් එසේ

ක්, පොතක්, අවසර පත්‍රයක් හෝ
හොත් ඉන් කොටසක්ද, එබඳු ලේකම්
පත්‍රයක හෝ ලේඛනයක සහතික
ානෙන යම්කිසි ලෙඛනයක් නැතහොත්
එබන්දක කොටසක් නැතහොත් උපුට
ක් නැතහොත් ඉන් කොටසක්ද යන
සත්‍ය ලෙස හෝ කූට ලෙස සෑදීම ; හෝ

ව, පොතක, අවසර පත්‍රයක, ලෙඛනයක
දක සහතික පිටපතක හෝ එබන්දකින්
කොටසක ඕනෑකමින් අසත්‍ය සටහනක්
වේ.



80. (1) පහත විස්තර කරන අන්දමේ ඥාති සම්බන්ධයක් ඇති ස්ත්‍රියක සමග ඒ සම්බන්ධය දනිමින්ම විවාහවීමේ ගිවිසුමක් ලෙස පෙනියන හෝ අදහස් කරන ගිවිසුමකට බැඳෙන්නාවූද නැතහොත් ඇය සමග සංවාසයේ හැසිර තිබෙන්නාවූ නොහොත් හැසිරීමට උත්සාහ කරන්නාවූද සෑම මුස්ලිම් පුරුෂයෙක්ම වරදකට වරදකාරයාවී, එසේ වරදකාරයා කිරීමේදී අවුරුදු තුනකට වැඩිනොවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාර ගතවීමට යටත් වන්නේය. — ව්‍යභිචාරි විවාහ ආදියට දඬුවම.

(අ) ඔහුගේ දුව නොහොත් එම පරම්පරාවෙන්ම පැවතෙන අන් කිසිවෙක් ; හෝ

(ආ) ඔහුගේ මව නොහොත් අන්කිසි පාරම්පරික වැඩිහිටියෙක් ; හෝ

(ඉ) ඔහුගේ සම්පූර්ණ සහෝදරිය නැතහොත් ඥාති සහෝදරිය ; හෝ

(ඊ) ඔහුගේ සම්පූර්ණ සොහොයුරාගේ නොහොත් සොහොයුරියගේද නැතහොත් ඥාති සොහොයුරාගේ හෝ ඥාති සොහොයුරියගේ දුව, නැතහොත් එබඳු සොහොයුරෙකුගෙන් හෝ සොහොයුරියකගෙන් පැවත එන්නෙක් ; හෝ

(උ) ඔහුගේ මවගේ හෝ පියාගේ නැතහොත් අන්කිසි පාරම්පරික වැඩිහිටියෙකුගේ සම්පූර්ණ හෝ ඥාති සොහොයුරියක් ; හෝ

(ඌ) ඔහුගේ භාර්‍යාවගේ මව නැතහොත් ආච්චි ;

(එ) ඔහුගේ භාර්‍යාවට වෙන මවකගෙන් ලැබී සිටින දුව හෝ මිනිබිරිය ; හෝ

(ඒ) ඔහුගේ පුතාගේ හෝ මුනුබුරාගේ හෝ පියාගේ හෝ මුත්තාගේ හෝ භාර්‍යාව හෝ වැන්දඹු භාර්‍යාව හෝ දික්කසාද කළ භාර්‍යාව ; හෝ

(ඔ) භාර්‍යාව ජීවත්ව සිටියදී භාර්‍යාවගේ සොහොයුරියද වේ.

සංවාසයේ යෙදීමේදී හෝ යෙදීමට තැත්කිරීමේදී ස්ත්‍රියගේ කැමැත්ත ඇතිව එසේ කිරීම මෙම උපවගන්තිය සඳහා සැළකියයුතු නොවන්නේය.

(2) පහත විස්තර කරන අන්දමේ ඥාති සම්බන්ධයක් ඇති පුරුෂයෙකු සමග ඒ සම්බන්ධය දනිමින්ම විවාහවීමේ ගිවිසුමක් ලෙස පෙනී යන හෝ අදහස් කරන ගිවිසුමකට බැඳෙන්නාවූද නැතහොත් ඔහු සමග සංවාසයේ හැසිරීමට එබන්දෙකුට ඉඩදෙන්නාවූද සොළොස්වියෙහි සිටි, නැතහොත් ඊට වැඩි වයසැති සෑම මුස්ලිම් ස්ත්‍රියක්ම, වරදකට වරදකාරයාවී, එසේ වරදකාරයා කිරීමේදී අවුරුදු තුනකට වැඩි නොවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගතවීමට යටත් වන්නීය.

(අ) ඇගේ පුතා හෝ එම පරම්පරාවෙන්ම පැවතෙන අන් කිසිවෙක් ; හෝ

(ආ) ඇගේ පියා හෝ අන් කිසි පාරම්පරික වැඩිහිටියෙක් ; හෝ

(ඉ) ඇගේ සම්පූර්ණ සහෝදරයා නැතහොත් ඥාති සහෝදරයා ; හෝ

(ඊ) ඇගේ සම්පූර්ණ සොහොයුරාගේ නොහොත් සොහොයුරියගේද, නැතහොත් ඥාති සොහොයුරාගේ නොහොත් ඥාති සොහොයුරියගේද පුතා, නැතහොත් එබඳු සොහොයුරෙකුගෙන් හෝ සොහොයුරියකගෙන් පැවත එන්නෙක් ; හෝ

(උ) ඇගේ මවගේ හෝ පියාගේ නැතහොත් අන් කිසි පාරම්පරික වැඩිහිටියෙකුගේ සම්පූර්ණ හෝ ඥාති සහෝදරයෙක් ; හෝ

(ඌ) ඇගේ ස්වාමිපුරුෂයාගේ පියා නැතහොත් මුත්තා ; හෝ

(එ) ඇගේ ස්වාමිපුරුෂයාට වෙන මවකගෙන් ලැබුණු පුතා හෝ මුනුබුරා ; හෝ

(ඒ) ඇගේ දුවගේ හෝ මිනිබිරියගේ හෝ මවගේ හෝ ආච්චිගේ පුරුෂයා නැතහොත් වැන්දඹු නැතහොත් දික්කසාද කළ පුරුෂයාද වෙත්.

මෙම වගන්තිය යටතේ චෝදනා ලැබ සිටින ස්ත්‍රියකට එකී වරද කරන අවස්ථාවෙහි ඈ සමග සංවාසයේ යෙදුන තැනැත්තාගේ බල පෑමට යටත්ව සිටි බැව් ඔප්පු කිරීම ඇගේ නිදහසට කරුණක් වන්නේය.

(3) එකී පාර්ශවකාරයින්ට අදාළවන මුස්ලිම් නීතිය අනුව වලංගු නොවන විවාහයක් මෙම පනතෙහි හෝ මෙම පනත යටතේවූ වරදක් සම්බන්ධයෙන් පවත්වනලද යම්කිසි විභාගයකදී කරනලද විනිශ්චයක හෝ ආඥාවක සඳහන් කිසිවකින්, වලංගුවන ලෙසට තේරුම් නොගත යුතුය.

විවාහ දික්කසාද ආදිය පිළිබඳ වැරදි සඳහා දඬුවම්

81. මෙහි පහත සඳහන් සෑම කෙනෙක්ම වරදකට වරදකාරයාවී පළමුවරට වරදකාරයා කිරීමේදී රුපියල් සියයකට වැඩි නොවන දඩයකටද, දෙවෙනි වරට හෝ ඊට පසුව වරදකාරයා කිරීමේදි රුපියල් එකසියයකට නැතහොත් දෙයාකාරයෙන් එක් ආකාරයකට හමසකට වැඩිනොවන කාලයකට බන්ධනාගාර ගතකිරීමට නැතහොත් ඉහතකී දඩය සහ බන්ධනාගාර ගතකිරීම යන දඬුවම් දෙකටම ද යටත් වන්නේය.

(අ) විවාහයක් ලියා පදිංචි කිරීමට හෝ කරවීමට මෙම පනතින් නියම කරනලද යුතුකමක් පැවරී ඇතිව සිට එසේ නොකරන හෝ නොකරවන තැනැත්තෙක් ; හෝ

(ආ) මෙම පනතේ විධිවිධාන යටතේ නොව අන් අන්දමකින් දික්කසාදයක් ලබාගැනීමට හෝ දික්කසාද කිරීමට හෝ දික්කසාදයක් ලියා පදිංචි කිරීමට හෝ යම්කිසි මුස්ලිම් කෙනෙකුට උපකාර කරන්නෙක් නැතහොත් අන් අන්දමකින් එබඳු වරදක් කිරීමට අනුබල දෙන්නෙක් ; හෝ

(ඉ) 56වෙනි වගන්තියේ 1වෙනි උප වගන්තියේ හෝ එම වගන්තියේ 4වෙනි උප වගන්තියේ හෝ සඳහන් යම් කිසි විධානයක් කඩකරන තැනැත්තෙක්ද වෙත්.

82. 22වෙනි වගන්තියේ හෝ 23වෙනි වගන්තියේ හෝ 24 වෙනි වගන්තියේ 4වෙනි උප වගන්තියේ හෝ විධිවිධාන කඩකිරීමෙන් එය දැනදැනම විවාහයක් ලියා පදිංචිකරන්නාවූ සෑම ලේකම් කෙනෙක්ද, එබඳු විවාහයක් ලියා පදිංචිකිරීමට උපකාර කරන්නාවූ නැතහොත් අනුබල දෙන්නාවූ සෑම කෙනෙක්ද වරදකට වරදකාරයාවී එසේ වරදකාරයා කිරීමේදී රුපියල් සියයක දඩයකට හෝ දෙයාකාරයෙන් එක් ආකාරයකට හමසකට වැඩිනොවන කාලයකට බන්ධනාගාරගතවීමට හෝ එකී දඩය හා බන්ධනාගාරගතවීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නෝය.

22වෙනි වගන්තිය හෝ 23වෙනි වගන්තිය හෝ 24වෙනි වගන්තියේ 4වෙනි උප වගන්තිය හෝ කඩකිරීමෙන් විවාහ ලියා පදිංචිකිරීමගැන දඬුවම්.

83. ක්වාසිකෙනෙකු නොවී මෙම පනත යටතේ දික්කසාදයක් ලියා පදිංචිකිරීම සඳහා අවසර පත්‍රයක් නිකුත්කරන නැතහොත් නිකුත්කරන්නාක් මෙන් ක්‍රියාකරන සෑම කෙනෙක්ද, ලේකම් කෙනෙකු නොවී මෙම පනත යටතේ විවාහයක් ලියා පදිංචි කරන නැතහොත් ලියා පදිංචි කරන්නාක් මෙන් ක්‍රියාකරන සෑම කෙනෙක්ද වරදකට වරදකාරයාවී එසේ වරදකාරයා කිරීමේදී රුපියල් සියයකට වැඩි නොවන දඩයකට හෝ දෙයාකාරයෙන් එක් ආකාරයකට හමසකට වැඩිනොවන කාලයකට බන්ධනාගාරගතවීම හෝ එකී දඩය හා බන්ධනාගාරගතවීම යන දඬුවම් දෙකටම යටත් වන්නෝය.

බලය නොමැතිව විවාහ දික්කසාද ආදිය ලියා පදිංචි කිරීම ගැන දඬුවම.

84. 64වෙනි වගන්තිය හෝ 65වෙනි වගන්තිය යටතේ ලබා ගන්නාලද මුදලක් එය අයිති තැනැත්තාට සෑහෙන හේතුවක් නොමැතිව වහා නොගෙවා පැහැර හරින සෑම ක්වාසි කෙනෙක්ම, වරදකට වරදකාරයාවී එසේ වරදකාරයා කිරීමේදී රුපියල් සියයකට වැඩි නොවන දඩයකට හෝ දෙයාකාරයෙන් එක් ආකාරයකට සමසකට වැඩි නොවන කාලයකට බන්ධනාගාරගතවීමට හෝ එකී දඩය හා බන්ධනාගාරගතවීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේය. එහෙත් මෙය 38වෙනි වගන්තියේ විධිවිධානවලට යටත් විය යුතුය.

ක්වාසි කෙනෙකු විසින් මුදල් අයිතිකාරයෙකුට එය නොගෙවා පැහැර හැරීමට දඬුවම.

85. 18වෙනි වගන්තියේ 1වෙනි උප වගන්තිය යටතේ අත්සන්කරනලද ප්‍රකාශයක, ඕනෑකමින් හෝ දැන දැනම හෝ යම් අසත්‍ය කිසිවක් ඇතුලත් කරන සෑම කෙනෙක්ම වරදකට වරදකාරයාවී එසේ වරදකාරයා කිරීමේදී රුපියල් සියයකට වැඩි නොවන දඩයකට හෝ දෙයාකාරයෙන් එක් ආකාරයකට සමසකට වැඩි නොවන කාලයකට බන්ධනාගාර ගතවීමට හෝ එකී දඩය හා බන්ධනාගාර ගතවීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේය.

ප්‍රකාශයක අසත්‍ය කිසිවක් ඇතුලත් කිරීම සඳහා දඬුවම.

86. පහත සඳහන් ක්‍රියාවක් කරන්නාවූ සෑම ලේකම් කෙනෙක්ම වරදකට වරදකාරයාවී එසේ වරදකාරයා කිරීමේදී රුපියල් සියයකට වැඩිනොවන දඩයකට යටත් වන්නේය :—

ලේකම්වරුන් විසින් සිය යුතුකම් ඉටු නොකිරීම ගැන දඬුවම.

(අ) මෙම පනත යටතේ විවාහයක් ලියා පදිංචි කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවකදී සෑහෙන හේතුවක් නොමැතිව එය ලියා පදිංචි නොකිරීම නැතහොත් එසේ ලියා පදිංචි කිරීමට බැරියයි කීම ; හෝ

(ආ) 11වෙනි වගන්තියේ සඳහන් කර තිබෙණ අවස්ථාවලදී හැර තමා පත්කරනු ලැබ සිටින ප්‍රදේශයෙන් පිටතදී කරගන්නාලද විවාහයක් ලියා පදිංචිකිරීම ; හෝ

(ඉ) 10වෙනි වගන්තිය යටතේ පත්කරනු ලැබීමෙන් පසු තමන්ගේ අක්තයෙහි සඳහන් සීමා හා නියම කඩකොට යම්කිසි විවාහයක් ලියා පදිංචිකිරීම ; හෝ

(ඊ) විවාහයක් සිදුකිරීමේදී එහි නොපැමිණ එකී විවාහය ලියා පදිංචිකිරීම ; හෝ

(උ) 18වෙනි වගන්තියෙන් හෝ 19වෙනි වගන්තියෙන් හෝ 58වෙනි වගන්තියෙන් හෝ විවාහයක් ලියා පදිංචි කිරීමේදී නැතහොත් විවාහයක් ලියා පදිංචි කිරීම පිළිබඳව 18වෙනි වගන්තියෙන් හෝ 19වෙනි වගන්තියෙන් හෝ 58වෙනි වගන්තියෙන් හෝ තමාට පැවරී තිබෙන යම් කිසි යුතුකමක් ඕනෑකමින් පැහැර හැරීම ; හෝ

(ඌ) මෙම පනත යටතේ සම්පාදිත නියෝගයක් ඕනෑ කමින් කඩකිරීමද වේ.

**'ඉද්දත්' කාලය තුළදී කරගන්නාලද විවාහයක් ලියා පදිංචිකිරීම ගැන දඬුවම.**

87. 'ඉද්දත්' කාලය තුළදී විවාහයක් කරගන්නාවූ, නැතහොත් මංගල්‍යොත්සවයක් මෙන් පෙනියන යම්කිසි උත්සවයකදී මනාලිය ලෙස සහභාගිවන්නාවූ, සෑම මුස්ලිම් ස්ත්‍රියක්ද, එබඳු විවාහයක් කරගැනීමට නැතහොත් එබඳු උත්සවයක් පැවැත්වීමට උපකාර කරන්නාවූ, අනුබල දෙන්නාවූ සෑම කෙනෙක්ද වරදකට වරද කාරයාවී එසේ වරදකාරයා කිරීමේදී රුපියල් සියයකට වැඩි නොවන දඩයකට යටත් වන්නෝය.

**දිස්ත්‍රික් ලේකම් තැනට ලේකම් පොත් ආදිය භාර නොදීම ගැන දඬුවම.**

88. 56වෙනි වගන්තියේ 3වෙනි උප වගන්තියේ නියමය පරිදි යම්කිසි පොතක්, ලේකම් පොතක් හෝ සූචි ලේඛනයක් දිස්ත්‍රික් ලේකම්තැන වෙත භාරදීමට බැරියයි කියන්නාවූ නොහොත් භාර නොදෙන්නාවූ සෑම කෙනෙක්ද, එම වගන්තියෙන් නියම කරන ලද පරිදි දිස්ත්‍රික් ලේකම්තැන වෙත භාරදිය යුතු නැතහොත් ඔහු විසින් භාරගතයුතු යම් කිසි පොතක්, ලේකම් පොතක් නොහොත් සූචි ලේඛනයක් නීතිය අනුව නිදහසට කරුණක් නොමැතිව ළඟ තබාගෙන සිටින සෑම කෙනෙක්ද වරදකට වරදකාරයාවී එසේ වරද කාරයා කිරීමෙන් පසු රුපියල් සියයකට වැඩි නොවන දඩයකට යටත් වන්නෝය.

**නඩු කියන්නන් සමග මැදහත්වීම ගැන දඬුවම.**

89. (1) ක්වාසි මණ්ඩලයක් ඉදිරියේ හෝ ක්වාසි කෙනෙකු ඉදිරියේ හෝ දැන් පවතින්නාවූ හෝ මතු ඇතිවිය හැකි හෝ යම් කිසි කාර්‍යයක් ඇති නඩු කියන්නෙකු නොහොත් අන්කිසිවෙකු සමග එකී නඩුව නොහොත් කාර්‍යය සම්බන්ධයෙන් සෑහෙන හේතුවක් නොමැතිව කතාබස් කරන නැතහොත් වචන වලින් හෝ සංඥාවලින් හෝ අන් අන්දමින් මැදහත්වීමට උත්සාහ දරන සෑම කෙනෙක්ම වරදකට වරදකාරයාවී එසේ වරදකාරයා කිරීමේදී රුපියල් සියයකට වැඩි නොවන දඩයකට යටත් වන්නෝය.

(2) මෙහි 1වෙනි උප වගන්තිය යටතේවූ වරදක් සම්බන්ධයෙන් රිජිස්ත්‍රාර් ජනරාල්තැන විසින් හෝ ඔහුගේ මෙහෙයීමෙන් හෝ ඔහුගේ කැමැත්ත ලිපියකින් ලබා නොගෙන හෝ හැර කිසි නඩුවක් නොපැවරිය යුතුය.

75වෙනි වගන්තියෙන් පැවරී තිබෙණ යුතුකම් පැහැරහැරීම ගැන දඬුවම්.

**90.** 75වෙනි වගන්තියෙන් පැවරුණ යුතුකම් ඉෂ්ට නොකර පැහැර හරින සෑම පොලිස් නිලධාරියෙක් නොහොත් ගම් මුලාදෑනියෙක්ම වරදකට වරදකාරයාවී එසේ වරදකාරයා කිරීමේදී රුපියල් පණහකට වැඩි නොවන දඩයකට යටත් වන්නේය.

ලේකම් පොත අත්සන් කිරීමට හෝ අවශ්‍ය මුද්දර සැපයීමට හෝ බැරිය කීම ගැන දඬුවම.

**91.** මෙහි පහත සඳහන් කරන අන්දමේ වරදක් කරන සෑම කෙනෙක්ම වරදකට වරදකාරයාවී එසේ වරදකාරයා කිරීමේදී රුපියල් විසි පහකට වැඩි නොවන දඩයකට යටත් වන්නේය :—

(අ) යම්කිසි විවාහයක් හෝ දික්කසාදයක් සම්බන්ධයෙන් ලේකම්පොතෙහි ඇතුලත් කරනලද විස්තර ප්‍රකාශයක් අත්සන් කිරීමට මෙම පනත යටතේ නියම කරනු ලැබූ කෙනෙකු සෑහෙන කරුණු නොමැතිව අත්සන් නොකිරීම නොහොත් එසේ කිරීම ඕනෑකමින් පැහැර හැරීම ; හෝ

(ආ) මෙම පනත යටතේ යම්කිසි නියමිත ගාස්තුවක් ගෙවීම සඳහා අවශ්‍ය මුද්දරයක් හෝ මුද්දර සැපයිය යුතු කිසිවෙකු සැපයීමට බැරියයිකීම හෝ එසේ කිරීම පැහැර හැරීමද වේ.

සාමාන්‍ය දඬුවම

**92.** මෙම කාණ්ඩයේ ඉහත දක්වූ වගන්තිවල සඳහන්නුවූ මෙම පනතෙහි හෝ ඒ යටතේ සම්පාදනය කරනලද නියෝගයක හෝ පෙනෙන යම්කිසි විධිවිධානයක් අනුව ක්‍රියා නොකරන්නාවූ හෝ නැතහොත් එබන්දකට වරුඹව ක්‍රියාකරන්නාවූ සෑම කෙනෙක්ම වරදකට වරදකාරයාවී එසේ වරදකාරයා කිරීමේදී රුපියල් සියයකට වැඩි නොවන දඩයකට යටත් වන්නේය.

ක්වාසි මණ්ඩලය හෝ ක්වාසි කෙනෙකු හෝ විභාගයක් පැවැත්වීමේදී අනිසි ලෙස හැසිරීම.

**93.** (1) ක්වාසි මණ්ඩලය හෝ ක්වාසිකෙනෙකු හෝ විභාගයක් පවත්වනවිට, එම ක්වාසි මණ්ඩලය ඉදිරිපිට හෝ ක්වාසිතැන ඉදිරිපිට පහත දක්වෙන ක්‍රියාවක් කරන තැනැත්තෙකුට රුපියල් විසි පහකට වැඩිනොවන දඬුවමකට මුදලක් ගෙවීමට නියම කිරීමට එකී ක්වාසි මණ්ඩලයට හෝ ක්වාසිතැනට හෝ පිළිවන.—

(අ) චණ්ඩ, අපහාසාත්මක, නින්‍දාසහගත හෝ තර්ජනාත්මක වචන පාවිච්චිකිරීම ; හෝ

(ආ) චණ්ඩ, අසභ්‍ය හෝ අශෝභන අඟුමින් අවයව සෙලවීම ; හෝ

(ඉ) එම විභාගයට ඕනෑකමින් අවහිර කිරීම හෝ බාධාකිරීමද වේ.

ක්වාසිකෙනෙකු එබඳු නියමයක් කළවිට එයට විරුඹව ක්වාසි මණ්ඩලයට අැපැල්ගැනීමට බලය තිබේ. එවිට එබඳු අැපැලකට පස්වෙනි උපලේඛනයේ දක්වෙන නීති අදාළවිය යුතුය.

එසේ දවූවත්, මෙම උපවගන්තිය යටතේ කරනලද ඇපැලකදී ක්වාසි මණ්ඩලය විසින් කරනලද තීරණයට විරුඬව ශ්‍රෙෂ්ඨාධිකරණ යට තව දුරටද ඇපැල්ගැනීමක් කළ නොහැකිය.

(2) 1වෙනි උප වගන්තිය යටතේ නියමකරනලද දඬුවම් මුදලක් නොගෙවනලද කල්හි නොගෙවනලද තැනැත්තා පදිංචිව සිටින ප්‍රදේශයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්තැන ඉල්ලීමක් කිරීමෙන් එකී මහෙස්ත්‍රාත්තැන විසින් නියම කරනලද දඩ මුදලක් සේ එම මුදල ඒ තැනැත්තාගෙන් අයකරගත හැකිය. ඒ මුදල එසේ අයකර ගැනීමෙන් පසු එකාබඬ අරමුදලට එක්කළ යුතුය.

(3) 2වෙනි උප වගන්තිය යටතේ කරන සෑම ඉල්ලීමක්ම දඬුවම් මුදල නියමකරන ලද්දේ ක්වාසි මණ්ඩලය නම් එම මණ්ඩලයේ ලේකම්තැන විසින්ද, අනිකුදු සෑම අවස්ථාවලදීම, දඬුවම් මුදල නියම කළ ක්වාසිතැන විසින්ද අත්සන් කළ යුතුය. තවද දඬුවම් මුදලෙහි ප්‍රමාණයද එය ගෙවීමට නියමකරනුලැබූ තැනැත්තාගේ නම සහ ලිපිනය ද නියම කළහැකි අනිකුත් විස්තරද එහි සඳහන්විය යුතුය.

## XIවෙනි කාණ්ඩය

### අතිරේක විධිවිධාන

න. 94. (1) පහත සඳහන් කරුණු සඳහා හෝ ඉන් කිසිවක් සඳහා හෝ නැතහොත් එබන්දක් සම්බන්ධයෙන් හෝ නියෝග පැන වීමට අමාත්‍යවරයාට පිළිවන :—

(අ) මෙම පනතින් විශෙෂ විධිවිධාන සලස්වා නැති කරුණු ක්වාසිවරුන් ඉදිරියේදී විභාග කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාපරිපාටිය ;

(ආ) ක්වාසිවරුන් විසින් නිකුත්කළ යුතු කැඳවීම් නියෝග සහ ඒවා ක්‍රියාවෙහි යොදවන අන්දම ;

(ඉ) ක්වාසි මණ්ඩලයට ගනුලබන ඇපැල්වල ද එබඳු ඇපැල් විභාග කිරීමට සම්බන්ධ වන හා අදාළවන සියලුම කාරණාවල ද මණ්ඩලයේ තීරණය සටහන් කිරීමේදීද ආකෘතිය හා පිළිවෙළ ;

(ඊ) පිස්කල් මුලාදෑනීන් හෝ වෙනත් මුලාදෑනීන් හෝ වෙනත් අය හෝ විසින් කැඳවීම් නියෝග භාරදීමේදී එය කළ යුතු අන්දම හා එසේ කිරීමේදී යටත්වියයුතු නියම ;

(උ) ක්වාසිකෙනෙකු ඉදිරියේ පවරනුලබන නඩු සඳහාද ක්වාසිවරුන් නිකුත්කරන කැඳවීම් නියෝග සඳහාද ක්වාසිවරුන් මණ්ඩලය විභාග කරන ඇපැල් සඳහාද, ශ්‍රෙෂ්ඨාධිකරණයට ඇපැල්ගැනීමේ අවසරය ලබාගැනීම හා ඇපැල්ගැනීම සඳහාද ගෙවියයුතු මුද්දර ගාස්තු සහ සාමාන්‍යයෙන් මුද්දරවලින් හෝ අන් අන්දමකින් ගෙවියයුතු ලෙස මෙම පනතින් නියම කළ යුතු සියලුම ගාස්තු ;

(එ) මහේස්ත්‍රාත්වරුන් හා රික්වැස්ට් නඩුකාරවරුන් ඉදිරියේ පවත්වනුලබන විභාග සංවිධානකිරීම පිණිස එවකට පනවා තිබෙණ නීතිය අනුව මෙම පනත යටතේ රික්වැස්ට් නඩුකාරවරුන් ඉදිරිපිටදී පවත්වන විභාගවලදී ගෙවියයුතු මුද්දර ගාස්තු නියමකර නොමැති විටෙක ගෙවියයුතු මුද්දර ගාස්තු ;

(ඒ) විවාහයක් හෝ දික්කසාදයක් පිළිබඳ ලේකම් පොතක ඇතුළත්වී තිබෙණ සටහනකින් සාදනලද සහතික පිටපතක් හෝ එයින් උපුටාගන්නාලද ලිපි කොටසක් සඳහාද 18වෙනි වගන්තියේ 1වෙනි උප වගන්තිය යටතේ කරනුලබන ප්‍රකාශයක් සඳහාද ගෙවිය යුතු මුද්දර ගාස්තු ;

(ඔ) රිජිස්ත්‍රාර් ජනරාල්තැන විසින් හෝ දිස්ත්‍රික් ලේකම් කෙනෙකු විසින් හෝ ක්වාසිවරුන්ගේ කායඝිාලද, ක්වාසි වරුන් හා ලේකම්වරුන් විසින් තබා තිබෙණ ලේකම් පොත් හා පොත්ද පරීක්ෂාකිරීම සහ ක්වාසිවරුන්ට සහ ලේකම් වරුන්ට විරුඬව කරනුලබන පැමිණිලි විභාගකිරීම ;

(ඕ) විවාහ හෝ දික්කසාද ලේකම් පොත්වල ඇතුළත්වූ ලිපිදෝෂ නිවැරදි කිරීම සහ එකී දෝෂ මෙම පනතේ නොහොත් එය යටතේ සාදනලද නියෝගවල විධිවිධාන පැහැරහැරීමෙන් හෝ ඕනෑකමින්ම නොසලකා හැරීමෙන් හෝ සිදුවී තිබේ නම් ඒ සඳහා ලේකම්වරුන්ට දඬුවම් නියමකිරීම ;

(ක) දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් හා ක්වාසිවරුන් විසින්ද ලේකම්වරුන් විසින්ද තැබිය යුතුවූද, නිකුත් කළ යුතුවූ ද නැතහොත් පාවිච්චිකළ යුතුවූද පොත් ලේකම් පොත්, සහතික පත්‍ර, අවසර පත්‍ර, ආකෘති පත්‍ර සහ සූචි ලේඛනවල පිළිවෙළ සහ ආකෘතිය ;

(ග) ක්වාසි මණ්ඩලයේ සභිකවරුන්ට හා ලේකම්තැනට ද, ක්වාසිවරුන්ට ද, මුස්ලිම් උපදේශකවරුන්ට හා ලේකම් වරුන්ට ද ගාස්තු වශයෙන්ද, ගමන් ගාස්තු ආදිය ඇතුළත් දීමනා වශයෙන්ද, අනිකුත් කරුණු සඳහා ද ගෙවියයුතු මුදල් ;

(ජ) 52වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියේ දෙවෙනි අතුරු විධානය යටතේ ක්වාසිවරුන් විසින් දිස්ත්‍රික් ලේකම්වරුන්ට ගෙවා තිබෙන්නාවූද නැතහොත් 38වෙනි වගන්තිය යටතේ ක්වාසිවරුන් විසින් කච්චේරිවල තැන්පත්කර තිබෙන්නාවූද මුදල් ඒවා අයිතිකාරයින් විසින් ඉල්ලා නොසිටි අවස්ථාවලදී යෙදිය යුතු අන්දම ;